පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 06 |

# අවසාන වාර පරීක්ෂණය - 2022

## නාට්‍ය හා රංගකලාව

විෂයය :- ..............................................................

පාසලේ නම : ..............................................................................

ඇතුළත්වීමේ අංකය : ............................ කාලය : පැය 02යි

### I කොටස

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. වෙද මුත්තාගේ චරිතය ඇතුලත් ජනකතාව තුල ඇතුලත් තවත් චරිත **දෙකක්** වන්නේ,

   I. බිසවුන් වහන්ස සහ රජතුමා
   II. රජතුමා සහ ගමරාළ
   III. කාලයා සහ බිසවුන් වහන්ස
   IV. රජතුමා සහ රජ කුමරිය

02. ජනකතාවක් ශබ්ද නගා කියවීම මගින් ලැබෙන වාසිදායක ප්‍රතිඵලයක් වන්නේ,

   i. ජාතක කතාවක ලක්ෂණ හඳුනාගැනීමට හැකි වීම
   ii. විරාම තැබීම , හඬ පාලනය පිළිබඳව නිවැරදි අවබෝධය ලබා ගැනීමට හැකි වීම
   iii. ජන කතාවක ගුණාංග පමණක් හඳුනා ගැනීමට හැකි වීම
   iv. ජන කතා ඇසීමට ඇති කැමැත්ත හීන වී යාමට හැකි වීම

03. නාට්‍යයේ තේමාව යන්නට සුදුසුම අර්ථකථනය වන්නේ ,

   i. නාට්‍යයේ මාතෘකාවයි
   ii. නාට්‍යයේ ශෛලියයි
   iii. නාට්‍යයේ කතාවයි
   iv. නාට්‍යයේ සමස්ත අදහසයි

04. නාට්‍යයක විශේෂ ලක්ෂණයකි ,

   i. කාලය සීමා රහිත වීම .
   ii. අසා රස විඳිය හැකි වීම .
   iii. සජීවී කලාවක් වීම.
   iv. තනිව රස විඳින කලාවක් වීම.

05. අප අවට පරිසරය හොඳින් නිරීක්ෂණය කිරීමෙන් නාට්‍ය හා රංග කලාව ඉගෙන ගන්නා සිසුන්ට වන වාසිදායක තත්වයක් වන්නේ ,

i. නාට්‍ය නිර්මාණ වලට පරිසර තේමාවන් පමණක් යොදා ගැනීමට හැකියාව ලැබීම
ii. මිනිසා විසින් කළ නිර්මාණ ගැන අවධානය යොමු කරමින් නාට්‍ය රචනා කිරීමට හැකියාව ලැබීම
iii. පරිසරයේ වස්තු හා සිද්ධි අනුකරණය කිරීමේ හැකියාව ලැබීම
iv. පරිසරය ඇසුරින් සුන්දර චිත්‍ර නිර්මාණය ප්‍රගුණ කිරීමට හැකියාව ලැබීම

06. " බුදු අම්මෝ අහස් විමන කඩා වැටෙනවෝ" යන කොටස අඩංගු වන්නේ

i. ළමා කතන්දරයක් තුළය
ii. ළමා ගීතයක් තුළය
iii. ළමා නාට්‍යයක් තුළය
iv. ළමා වැඩසටහනක් තුළය

07. ඇලඩින් සහ පුදුම පහන සුරංගනා කතාවේ ඇතුළත් අධිමානුෂීය චරිතයක් වන්නේ,

i. ඇලඩින්
ii. වඳුරුපැටියා
iii. භූතයා
iv. කුමාරිකාව

08. නාට්‍යයක ආනුෂංගික අංගයකි,

i. පසුතල නිර්මාණ
ii. නාට්‍ය පිටපත
iii. රංග විධාන
iv. නාට්‍ය අධ්‍යක්ෂණය

09. නළුවෙකුට ශ්වසන අභ්‍යාස වල නිරත වීමෙන් ,

i. ආංගික අභිනය සාර්ථක කර ගත හැකිය
ii. වාචික අභිනය සාර්ථක කර ගත හැකිය
iii. සාත්වික අභිනය සාර්ථක කර ගත හැකිය
iv. ආහාර්යය අභිනය සාර්ථක කර ගත හැකිය

10. ළමා නාට්‍යක විශේෂ ලක්ෂණයකි ,

i. සතුටුදායක අවසානයක් තිබීම
ii. චරිත විශාල සංඛ්‍යාවක් තිබීම
iii. දිලිසෙන රංග වස්ත්‍ර තිබීම
iv. සත්ව චරිත අනිවාර්යයෙන්ම තිබීම

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට ගැලපෙන පිළිතුර යා කරන්න.**

11. නළුවා විසින් තම රංගනයේ දී භාවිතා කරයි — වෙස්මුහුණු
12. ප්‍රේක්ෂකයාට චරිතය මනාව හඳුනා ගැනීමට උපකාරී වේ — රංග වස්ත්‍ර
13. නාට්‍යයක අවශ්‍ය නම් පමණක් නිර්මාණය කර ගත හැකිය — නාට්‍ය සංගීතය
14. නළුවාට රංගනයේ දී හැඟීම් දැනවීමට පහසුවක් සපයයි — පසුතලය
15. තාත්වික අභිනයට බාධා ඇති කරයි — රංග භාණ්ඩ

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

කොප්පර කොප්පර පිපිඤ්ඤා පස්ස බැලුවොත් දෙසඤ්ඤා කියමින් 16. .................................... ඈත අතීතයේ සිට අප දැන සිටි ජන ක්‍රීඩාවකි.17........................වැනි ජන ක්‍රීඩාවක් තුළින් 18................................කරමින් නාට්‍යානුසාරී ලෙස ද සිදු කළ හැකිය. ජන ක්‍රීඩා ඇසුරින් 19................................ නිර්මාණ ද බිහි වී ඇති අතර ජන කතා ඇසුරින්ද බොහෝ නිර්මාණ බිහි වී ඇත.ජන කතා ඇසුරින් 20.................... ද බිහි වී ඇති අතර නරිබෑණා එයට හෙඳම උදාහරණයයි.

( ගීත/චරිත අනුකරණ / ලේන්සු හැංගීම / නාට්‍ය / එළුවන් කැම) (ලකුණු 2x20= 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නයට අමතරව තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.**

01. පුංචි අපට දැන් තේරෙයි නාට්‍යයට අදාලව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   I. එම නාට්‍ය අධ්‍යක්ෂණය කළ අධ්‍යක්ෂවරියගේ වෙනත් නාට්‍ය 02ක් සඳහන් කරන්න.
   II. එම නාට්‍ය රස වින්දනය කළ පසු ඔබ ලබා ගත් ආදර්ශයක් ලියන්න.
   III. මෙම නාට්‍යයේ දක්නට ලැබෙන සමූහ ලෙස පැමිණෙන චරිත කාණ්ඩ 02ක් නම් කරන්න.
   IV. මෙම නාට්‍යයේ ප්‍රධාන චරිත දෙකක් නම් කර එම චරිතයේ දක්නට ලැබෙන යහපත් ගුණාංගයක් ලියන්න.
   V. ” හපොයි මටත් තේරෙනවා කාටත් හරියට වැඩ බව ” යැයි කියන චරිතය ඉන් අනතුරුව සිදු කරන්නේ කුමක්ද?
   VI. මෙම නාට්‍යයේ ඔබ කැමති චරිතයකට සුදුසු ඇඳුම් නිර්මාණයක් ඇඳ වාර්ණ කරන්න.

(ලකුණු 2 x 6 = 12)

02. සෙල්ලම් සිතින්වත්
යමකිසි තරහකින්වත්
මරණ සිතකින් වත්
සතුන් හට වද දීම නොහොබිත්

ඉහත සඳහන් සිරිත් මල්දමේ කවිය අධ්‍යනය කර කවියේ අර්ථය දැනවෙන ආකාරයට කතන්දරයක් ලියන්න.

(ලකුණු 12)

03.

I. රංග ආභරණ සැකසීම සඳහා යොදා ගත හැකි ස්වභාවික අමුද්‍රව්‍ය 02ක් නම් කරන්න. (ලකුණු 02)

II. රංග ආභරණයක තිබිය යුතු ලක්ෂණ 04ක් ලියන්න. (ලකුණු 04)

III. අපතේ යන ද්‍රව්‍ය සහ ස්වභාවික ද්‍රව්‍ය භාවිත කර ඔබ විසින් පන්තිකාමරයේ දී රංග ආභරණයක් සකස් කරන ආකාරය රූප සටහන් සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

04. පහත රූපය හොඳින් නිරීක්ෂණය කොට පිළිතුරු සපයන්න.



I. ඉහත සඳහන් රූපයේ දක්නට ලැබෙන සිදුවීමක් ලියන්න

(ලකුණු 02)

II. එම සිදුවීමට අදාලව නිර්මාණාත්මක අනුකරණයක් සිදු කරන්නේ නම් ගත හැකි චරිත 04ක් නම් කරන්න.

(ලකුණු 04)

III. ඔබ විසින් නම් කළ චරිත 2ක් ගෙන ඒ චරිත 2ක් ගෙන එම චරිත 02 ක ඇතුලත් කොට කෙටි සංවාදයක් ගොඩ නගන්න. (ලකුණු 06)

IV.

05.

I. ජනකතාවක් යන්න අර්ථ දක්වන්න. (ලකුණු 02)

II. ඔබ දන්නා ජන කතා 04ක් ලියන්න (ලකුණු 04)

III. ඉන් එක් ජනකතාවක් තෝරාගෙන කතාවේ තේමාවට හානි නොවන ලෙස වෙනස් කොට නැවත ලියන්න. (ලකුණු 06)

06.

I. සරල වෙස් මුහුණක් සකස් කිරීමට අවශ්‍ය අමු ද්‍රව්‍ය 04ක් නම් කරන්න. (ලකුණු 02)

II. වෙස් මුහුණක් සකස් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 02ක් ලියන්න. (ලකුණු 04)

III. සත්ව චරිතයට ගැලපෙන වෙස් මුහුණක් සරලව සකස් කර ගන්නා ආකාරය රූප සටහන් සහිතව පියවරෙන් පියවර විස්තර කරන්න. (ලකුණු 06)

07. " සුරිත් හරිම කම්මැලි ළමයෙක්. ඉගෙන ගන්නේ 6 ශ්‍රේණියේ පාඩම් කරන්න, ලියන්න, කියවන්න හරිම කම්මැලියි. සුරිත්ගේ අම්මයි තාත්තයි හැම මාසෙම එයාට පොතක් ගෙනත් දුන්නත් කවදාවත් ඒ පොත් අල්ලලා බැලුවෙවත් නෑ. ඒ පොත් තිබ්බ රාක්කය තිබ්බෙ සුරිත්ගේ නිදන කාමරේමයි. ඒ රාක්කෙ දූවිලි වහල මකුළු දැල් පිරිල තිබ්බෙ . ඔන්න දවසක් සුරිත් රෑ නිදාගෙන ඉන්නකොට පොත් රාක්කය සෙලවෙන අමුතු සද්ද ගොඩක් ආවා ........."

මේ සිදුවීම ඉදිරියට ගෙන යමින් නාට්‍යයක් රචනා කරන්න. (ලකුණු 12)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න